# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/69 - 2019 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2019.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 06/2018)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2019 අප්‍රේල් මස 05 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ආර්. දේශප්‍රිය,
*වැඩබලන ලේකම්,*
මුදල් අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

*යෝජනාව*

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.


1A - G 29924 — 47 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **22.02** | | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවාවූ හෝ රස කළාවූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග** | | | |
| | | | | | | |
| | 2202.99 | -- | අනෙකුත් : | | | |
| | 2202.99.10 | --- | තේ පානයක් ලෙස | | 30% | ලීටර් |
| | 2202.99.20 | --- | ඖෂධ ලෙසට ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අනුමත කළ පාන වර්ග | | 30% | ලීටර් |
| | 2202.99.30 | --- | ''ශක්ති ජනක පාන'' ලෙස අලෙවි වන පාන වර්ග | | 30% | ලීටර් |
| | 2202.99.40 | --- | ශාඛ සාර පාදක කරගත් පානයන් | | 30% | ලීටර් |
| | | --- | පළතුරු හෝ එළවළු යුෂ පාදක කරගත් පානයන් : | | | |
| | 2202.99.51 | ---- | මිලි ලිටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.59 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| | | --- | කිරි පාදක කරගත් පානයන් | | | |
| | 2202.99.61 | ---- | මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.69 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| | 2202.99.70 | --- | ධාන්‍ය හෝ ගස්වල හට ගන්නා කට්ට සහිත ගෙඩි, ඇට පාදක කරගත් පානයන් | | 30% | ලීටර් |
| | | --- | අනෙකුත් : | | | |
| | 2202.99.91 | --- | මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.99 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| 14.04 | 1404.90.10 | --- | බීඩි කොළ | | 30% හෝ කි. ග්‍රෑමයට රු. 250/- | කි. ග්‍රෑ. |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.